

# සිංහල අවුරුද්දේ තනිව නැසෙමු ද? එක් ව නැගෙමු ද?

මේ සිංහල හා දමිළ අලුත් අවුරුදු සමයයි. අවුරුදු උදාවත් සමගින් ඔබ දෝතට පිළිගැන්වෙන සන්නස තුළින් හරවත් යමක් උදෙසා පෙනී සිටීම කාගේත් යුතුකමක් යයි හැඟෙයි. එය පාඨකයාගේ ඒකායන ප්‍රාර්ථනය ද වන්නේ ය.

හිරු සඳු අතරින් තත්පර ගෙවී යද්දී ඒ පරයන්නට උනුන් හඹා දුවන යුගයක, පරිසරයක අද අප අතරමං වී ඇතිදෝ යි විටෙක සිතෙයි. මිනිසා සඳ මත විස්කම් පෑයේ වසර එක්වා දහස් නවසිය හැට නවයේ දී ය. මතු දා ඔහු සක්වළ මතු නොව මන්දාකිණී, ක්ෂීර පථ පවා දිනනු ඇත. මේ වන විටත් මුළු පෘථිවි ධරණී තලයම එක ම නගරයක් වී හමාරය. අප ඒ නගරයේ සරන්නන් බවට පත් වී හමාර ය. එවන් නුවරක වාහල් කඩ පසු කරමින් මේ යන ගමනේ අප වැළඳ ගන්නා එකම දෙය හුදෙකලාව පමණකැයි සිතෙන වාර අනන්ත ය, අප්‍රමාණ ය. අප සොයුරු ජගත් ජේ එදිරිසිංහයන් ගේ ගේය පද රචනාවක් සිහියට නැංවේ.

නුවර වාහල් දොරටු පසුකර
ගම් නියම් ගම් සොයා පියමැන
නාඳුනන දේසේ සරන දන අතරේ
හුදෙකලා මිනිසා
තනිව තැවෙනා හුදකලා මිනිසා

**සැබැවින් ම අපි හුදෙකලා වී ඇත්තෙමු. දිනෙන් දින අප අතරින් දුරස් වන සාර ධර්ම මිනිස් කම් හීනතාවයෙන් හුදෙකලා වී ඇත්තෙමු. මව් කුසින් අප මෙළොව දකින දා අප අත මිට මොළවාගෙන ආවේ මිනිස් කම පමණකි. මව් බිමෙන් අප වෙන් වන ප්‍රේරණය වූයේ සාර ධර්ම යි. අප අදහන ආගම කුමක් වුව ද ඒ වායේ හරය වුයේ අප යහ මගට යොමු කරවන සාර ධර්මයි. වසර දෙසියයක කෙටි ඉතිහාසයක් ඇති කැන්ගරු දේශයට අප ගෙන ආවේ මොනවා ද? මව් රටේ ඇතැම් විද්‍යාල වල ඉතිහාසය ම වසර දෙසීයකි. ශ්‍රී ලංකා ප්‍රෞඪ පුරාණය ගැන යළි යළිත් සිහිකළ යුතු නොවේ.**

සැබෙවින් ම අපි හුදෙකලා වී ඇත්තෙමු. දිනෙන් දින අප අතරින් දුරස් වන සාර ධර්ම මිනිස් කම් හීනතාවයෙන් හුදෙකලා වී ඇත්තෙමු. මව් කුසින් අප මෙළොව දකින දා අප අත මිට මොළවාගෙන ආවේ මිනිස් කම පමණකි. මව් බිමෙන් අප වෙන් වන ප්‍රේරණය වූයේ සාර ධර්ම යි. අප අදහන ආගම කුමක් වුව ද ඒ වායේ හරය වුයේ අප යහ මගට යොමු කරවන සාර ධර්මයි. වසර දෙසියයක කෙටි ඉතිහාසයක් ඇති කැන්ගරු දේශයට අප ගෙන ආවේ මොනවා ද? මව් රටේ ඇතැම් විද්‍යාල වල ඉතිහාසය ම වසර දෙසීයකි. ශ්‍රී ලංකා ප්‍රෞඪ පුරාණය ගැන යළි යළිත් සිහිකළ යුතු නොවේ.

ශ්‍රී ලංකා සම්භවයක් සහිත මේ සමාජ උප කුළකයේවත් අපට හුදෙකලා නොවී සිටින්නට ඇත්නම්? සුදු ජාතිකයන්ගේ අගනා දේ පමණක් අපට ළං කර ගැනීමට හැකි නම්?

කාලය ගැන ම සිහිපත් කෙරෙන අවුරුදු සමයේ එය ම නිදසුන් කොට ගැනීම යෙහෙකි. අප මුතුන් මිත්තන් සුබ නැකැත් වේලාවන් අනුගමනය කරමින් ගියා වූ ගමනේ සාර්ථකත්වය අදහාගනු නොහේ. රුවන්වැලිය, ජේතවනය වැනි මහා ඉදිකිරීම් නිමවන්නට කාලය පිළිබඳව මනා කළමණාකාරීත්වයක් තිබිය යුතුමැයි. සහල් අපනයනය කිරීමට තරම් වූ ස්වයංපෝෂිත තත්ත්වයකට රට නංවන්නට කාලය මතු නොව කාලගුණය ද ගලපා ගන්නට අප පැරැන්නෝ රුසියෝ වූහ. ඔවුන් මේ සැම දේ කරන්නට ඇත්තේ කළියුගයේ මෙන් ඉලෙක්ට්‍රොනික හෝරා යන්ත්‍ර දවසේ පැය විසිහතරේම දිය ගොඩ දෙකේම පළඳාගෙන හිඳීමෙන් නොවේ. හිරු දෙස බලමිනි. සඳුට අනුව දින මාස ගණිමිනි. සෙවනැල්ලේ දිග මනිමිනි. වසරේ වැඩි කාලයක් මන්දාරමින් වැසී ගත් මෙනුවර වාසීන්ට හිරු සඳු සෙවණැලි පිහිටෙන් කාලය මනින්නට කෙරෙන යෝජනාවක් නොවේ මේ. වේලාවට තමන්ගේ කටයුතු කිරීමට උනන්දු වන්නන්ට ඔරලෝසුවේ වර්ගය ගැටලුවක් නොවේ. තම වේලාවට ලන්සුවක් තබන්නට අන් අයගෙ වේලාවේ වටිනාකම් තක්සේරු කිරීමට ගණක යන්ත්‍ර වුවමනා ද? තමන්ගෙ වේලාව ගැන ම කතා කරන කිසිවකු වේලාවට වැඩ කරනවා දැයි අප සමාජ උප කුලකයේ දනන්ගෙන් ම ඇසීමට කැමැත්තෙමි. සුදු ජාතිකයන් ගේ වෙලාවට වැඩ කිරීමේ මහඟු ගුණය නිසා ම සෘජුවම හෝ වෙනයම් ආකාරයකින් පැනැවුණ නීති හමුවේ අපි ද ආයාසයෙන් හෝ වේලාවට වැඩ කරන්නෙමු. එසේ වුව ද අප අප අතරේ එදිනෙදා කෙරෙන කියවෙන දෑ අතරේ දී නම් එය හිතලුවක් පමණක් මැයි.

කාලය පිළිබඳව ලියැවුණ ද අන් සැම දෙයක් පිළිබඳවද කීමට හෝ ලිවීමට ඇත්තේ මේ දේ මැයි. අන් අයත් තමන් මෙන්ම සිතීමේ මූලික මිනිස් සාරධර්මතාව ගිළිහී යාම මීට මූලික හේතුව යැයි නොසිතිය හැකි ද? කණ්ඩායම් හැඟීම් ඇති කිරීම මෙරට සැම ආයතනයක ම ප්‍රධාන මාතෘකාවක් බවට පත් වී ඇත්තේ ය. අප කණ්ඩායම් හැඟීමෙන් එකමුතු වී රට රටවල් පවා දිග් විජය කළේ මීට වසර සිය දහස් ගණනකට පෙරදී ය ඒක රාශී කරවීමේ මහා ශක්තිය වනුයේ මිනිස්කම නොවේ ද? මිනිස් කම මිටින් ගෙන උපන් අප එකම මිනිස් කුලයේ සත්ත්වයන් පිරිසක් ලෙසින් සිතන්නට මැළි වන්නේ මන්දැයි සිතනු නොහේ. එදා අප මුතුන් මිත්තන් බුලත් හුරුල්ලකින් කළ දේ අද ඩොලර් මිලියන ගණනකින් පවා කළ නොහැකි විස්කමක් නොවේ ද? දිනෙන් දින බිඳී බිඳී යන කල්ලිවාදය වෙනුවට බැඳී බැඳී එන මිනිස් පුරයක සවිය පිළිබඳව සිතන්නට සුදුසු ම කාලයයි අවුරුදු සමය. ඒ සිතිවිලි හමුවේ කිසි දා අප හුදකලා නොවනු ඇත. අප සිහින නොමියෙනු ඇත.

**සිසිර දිසානායක**

## සන්නස වැකිය

### පළමු සන්නස

බක් මාසය වසරේ සුබ මාසය යි. සන්නස ඔබ අතට පත් කරන්නට අපට ඉඩකඩ සැළසුණ මේ මාසය සුබ මාසයක් ම විය යුතුය.

සන්නස ඔබ අතට පත් වන්නේ මාස ගණනක වෙහෙසක ප්‍රතිඵලයක් ලෙස ය. සන්නසේ අප බලාපොරොත්තු වන කාරණා තුනක් ඇත. මේ කාරණා තුනම අපට එක සේ වැදගත් සේ ම ලේඛකයන් වශයෙන් අපේ වගකීමක් ද වන්න් යයි අපි සිතමු.

පළමුව අපේ ආදරණීය දේශයේ සත්‍යවාදී ලේඛකයනට පීවන අත්වැලක් සපයන්නට අපි උත්සාහ කරන්නෙමු. දෙවෙනුව මෙරට වාසී අපේ සහෝදර නිර්මාණ කරුවනට නිර්මාණ කාරියනට සිය නිර්මාණ ඉදිරිපත් කරන්නට තවත් ඉඩ කඩක් විවෘත කර දෙන්නෙමු. මේ කාරණා දෙක සාක්ෂාත් කරගන්නා අතරේ සන්නස ශ්‍රී ලාංකාවේ පළ කෙරෙන පුවත්පතක තවත් කාබන් කොපියක් නොවන තැනක තබා ගන්නට අපි උත්සාහ ගන්නෙමු.

මේ ගමන පහසු නොවන බව අපි දන්නෙමු. අප සමග එක්ව සිටින සැබෑ ලේඛක ලේඛිකාවනගේ ශක්තිය අපේ ශක්තියයි. අපහසු කාරිය පළමු පියවර තැබීමයි. අද අපි පළමු පියවර තබන්නෙමු. එතැන් සිට පියවර දහසක් තබන්නට අපි අදිටන් කර ගන්නෙමු.

ඉතිහාසය ප්‍රතාපවත් වන්නේ දෑත් දෙපා අකුළා ගෙන සිටින කුසීත මිනිසුන්ගෙන් නොව, එය වෙනස් කිරීමට හෝ වෙනස් කිරීමට ප්‍රයත්න දරන හෝ ශ්‍රේෂ්ඨ මිනිසුන් ගෙනි.


සන්නස

සංස්කරණය
ජගත් ජේ එදිරිසිංහ

සන්නසර පිරිවර
සිසිර දිසානායක
ශ්‍රීනාත් මද්දුමගේ
ආනන්ද කුමාරසිරි
අසෝක සුබසිංහ
සාලිය ගලප්පත්ති



විමසීම්
සන්නස
PO Box 172
Reservoir
Vic 3073
Tel: 0425 720 932
Fax: 039 3104196



සන්නසේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාවගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිඹිබු නොවන බව සලකන්න. සන්නස සඟරාවෙන් උපුටා ගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත.